**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.35,290,414 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර, දෙසැම්බර් මාසයට අදාළ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු බැවින් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම සහ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.8,791,150 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ අයවිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.384,383 ක් ලැබිය යුතු පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව | ලැබිය යුතු පොලී ආදායම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.71,105 ක හිඟ වැටුප් ගෙවීම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව | උපචිත පදනම මත ගිණුම් ඉදිරිපත් කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සැපයුම් ණයහිමි වටිනාකම දෙවරක් ගණනය කර තිබීම නිසා ශේෂය රු.201,200 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 04 කට අදාළ වටිනාකම්, ඊට අදාළ උපලේඛන වල දැක්වෙන වටිනාකම් සමඟ රු.105,447 කින් නොසැසඳුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වා ඇත | ගිණුම් පොත්පත් හා ලේඛන සසඳා නිවැරදි අගයන් හඳුනාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------<br>2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරික්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 26000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණ අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට අනුව නැවත ඉන්ධන පරික්ෂාවක් කළ යුතු වුවද, සභාවේ වාහන 05 ක් සඳහා එපරිදි කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේ සිට ඉන්ධන දහන පරික්ෂාව කිරීමට කටයුතු කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර චක්‍රලේඛ<br>----------------<br>2019 නොවැම්බර් 19 දිනැති අංක 2019/14 දරන උතුරු මැද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය<br>-----------------<br>04 ඡේදය | 2023 දෙසැම්බර් 31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර 2024 පෙබරවාරි 15 දිනට පෙර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කඩිනමින් වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්මවූ වියදම රු.2,719,241 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.3,504,601 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,469,842 | 2,167,668 | 2,645,906 | 1,288,958 | 1,321,500 | 1,545,544 | 873,133 | 1,767,196 |
| කුලී | 5,970,935 | 3,844,449 | 3,660,616 | 1,303,333 | 3,433,710 | 4,596,668 | 3,771,718 | 1,119,500 |
| බලපත්‍ර ගාස්තු | 269,250 | 375,063 | 360,813 | 46,250 | 377,000 | 385,800 | 353,800 | 32,000 |
| වෙනත් ආදායම් | 75,086,430 | 39,238,000 | 71,762,246 | 12,817,319 | 72,314,860 | 29,686,466 | 16,649,151 | 45,341,565 |
| | ----------- | ----------- | ----------- | ----------- | ----------- | ------------ | ----------- | ----------- |
| එකතුව | 82,796,457 | 45,625,180 | 78,429,581 | 15,455,860 | 77,447,070 | 36,214,478 | 21,647,802 | 48,260,261 |
| | ======== | ======= | ======== | ======= | ======= | ======= | ======= | ======= |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | අවුරුදු 05 කට වරක් වරිපනම් තක්සේරු කළ යුතු වුවද, 2012 වර්ෂයේ තක්සේරුව අනුව 2023 වර්ෂය තුළද වරිපනම් අයකර තිබුණු නමුත් වර්ෂ අවසානයට රු.1,288,958 ක හිඟ ආදායමක් පැවතුණි. | හිඟ වරිපනම් ආදායම හා ප්‍රවර්ථන වර්ෂයේ වරිපනම් ආදායම අය කිරීම සඳහා ජංගම සේවා හා වෙනත් වැඩසටහන් සංවිධානය කර ඇති බව | නියමිත ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ග්‍රාම නිලධාරි වසම් 02 ක් දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන 2023 ජනවාරි 05 දින ගැසට් කර තිබූ නමුත්, දේපල තක්සේරු වාර්තාව ලබාගෙන නොතිබීම හේතුවෙන් වරිපනම් අයකර ගත නොහැකි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තොරතුරු යොමුකර ඇති බවත්, අනුමැතිය ලැබුණු පසු ගැසට් පත්‍රයේ පල කිරිමට කටයුතු කරමින් පවතින බවත් | දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් අයකළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී හා දඩ ආදායම රු.581,771 ක් විය. | ගෙවීම් පැහැර හරින්නන් වෙත නෛතිකව පියවර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අප්‍රමාදව නිරවුල් කරගත යුතුය. |

| | | |
|---|---|---|
| **(ඇ) බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.947,460 ක හිඟ වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු ආදායමක් පැවතුණි. | බදු අයකර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | ආදායම් නියමිත පරිදි අයකළ යුතුය. |
| **(ඈ) වෙනත් ආදායම්**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කසල ගාස්තු ආදායම රු.640,000 ක් වූ අතර, හිඟ ගාස්තු සම්බන්ධව කටයුතු කිරීමේ ප්‍රමාදයක් පැවතුණි. | හිඟ මුදල් කපාහැරීම සඳහා අනුමැතිය ලද පසු ලේඛන වලින් අදාළ ශේෂයන් ඉවත් කිරීමට කටයුතු කරන බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**<br>වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 25 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී අයවැය කාර්යයන්ට අදාළ ලෙස වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් ඉටුකරගැනීම සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන සැලසිය යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත රු.19,269,077 ක් වැය කර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව 2022 වර්ෂයේදී ඉදිකිරීම් නිම කරන ලද සේවාගම පොදු වෙළඳ සංකීර්ණය තනි ව්‍යාපාර ඒකකයක් පවත්වා ගැනීමට යෝග්‍ය අයුරින් සකස් කර ඇති අතර, ටෙන්ඩර් ලබාදීමට කටයුතු කළද, ටෙන්ඩර් ලබාගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම මත නිෂ්කාර්යව පවතී. | 2024 වර්ෂයට කොටස් වශයෙන් බදු දෙන බව | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ 36 ක පුරප්පාඩු පැවතුණි. | පළාත් පාලන කොමසාරිස්තුමා සහ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කර ඇති බව | පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 23 ක් ස්ථාන මාරු නොලබා වසර පහකට වඩා වැඩි කාලයක් එකම ස්ථානයක අඛණ්ඩව සේවය කරන බව නිරීක්ෂණය විය. | ඒකාබද්ධ සේවාවල නිළධාරින්ගේ හා සේවකයින්ගේ ස්ථාන මාරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් වාර්ෂිකව සිදු කරනු ලබන බවත්, අනෙකුත් සේවා ස්ථාන මාරු දෙපාර්තමේන්තුගත ස්ථාන මාරු වන අතර එය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සිදු කළ යුතු බව | නියමිත පරිදි ස්ථාන මාරුවීම් සිදුකළ යුතුය. |